**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**
**காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்**
**OFFICE ON MISSING PERSONS**

---

**මාධ්‍ය නිවේදනය** **2018 දෙසැම්බර් මස 28**

## මන්නාරමේ පිහිටි සමූහ මිනීවල සම්බන්ධ විමර්ශන කටයුතු වලට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහය ලබා දෙයි

2018 දෙසැම්බර් 18 සිට දෙසැම්බර් 20 වන දින දක්වා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) විසින් මන්නාරම නගරයේ සතොස ගොඩනැගිල්ලේ පිහිටි සමූහ මිනී වලෙන් සාම්පල හයක් රේඩියෝ කාබන් ඩේටින් (Radio Carbon Dating) සඳහා තෝරාගැනීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කරන ලදී (නඩු අංකය බී/232/2018). මන්නාරම් දිස්ත්‍රික්කයේ මහේස්ත්‍රාත්වරයා වන ගරු ටී. සරවනරාජා මහතාගේ මෙහෙයවීම යටතේ මෙම සාම්පල තෝරා ගැනීමේ ක්‍රියාවලිය කැධෑම් භූමියේදී සිදු කරන ලදී. සාම්පල තෝරා ගැනීමේ ක්‍රියාවලිය සඳහා විශේෂඥ අධිකරණ වෛද්‍ය නිළධාරී කාර්යාලයේ නියෝජිතයින්, කැළණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියෝජිතයින්, පොලීසියේ නියෝජිතයින් (අපරාධ ස්ථාන නිලධාරීන් (Scene of Crime Officers – SOCO) - අපරාධ විමර්ශන අංශය) සහ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ඇතුලත් විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නියෝජනය කරමින් මිරාක් රහීම් සහ කේ. වේන්තන් යන කොමසාරිවරුන් නිරීක්ෂකයින් වශයෙන් සහභාගී විය. තවද අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් නියෝජනය කරමින් නීතිඥයින් සහ පුරවැසි කමිටුවේ සාමාජිකයකු ද නිරීක්ෂකයින් ලෙස සහභාගී විය.

රේඩියෝ කාබන් ඩේටින් තාක්ෂණය මගින් අස්ථි සහ දත් සාම්පලවල අඩංගු වන කාබන් 14 අගය ඇස්තමේන්තු ගත කළ හැකි අතර එමගින් ශාක හෝ සත්ත්වයින් ජීවත් ව සිටි කාල පරිච්ඡේදය අනුමාන කළ හැකිය. පුරාවිද්‍යා සහ අධිකරණ විද්‍යා ක්ෂේත්‍ර වල කරනු ලබන පරීක්ෂණ සඳහා මෙම තාක්ෂණය බෙහෙවින් භාවිත කරනු ලැබේ. මන්නාරමේ පිහිටි සමූහ මිනී වලෙන් ලබාගත් අස්ථි සහ දත් සාම්පල බොම්බ් පල්ස් කාබන් 14 තාක්ෂණ ක්‍රමවේදය (Bomb Pulse Carbon 14 technique) භාවිතා කර පරීක්ෂණ පවත්වන විදේශීය පර්යේශණාගාරයකට යොමු කිරීමට තීරණය කර ඇත. මෙම තාක්ෂණ ක්‍රමවේදය භාවිතා කළ විට දෙවන ලෝක යුද්ධයට පසු මිය ගිය පුද්ගලයන්ගේ ඇටසැකිලි හඳුනා ගැනීම තුළින් කාල වකවානු නිර්ණය කිරීම පහසු කළ හැක.

මන්නාරම් දිස්ත්‍රික් මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිළධාරී වෛද්‍ය රාජපක්ෂ මහතා සඳහන් කර සිටියේ ණිකැධෑම් කටයුතු ආරම්භ කර දින 118 කින් පසුව පිරිමින්, ගැහැණුන් හා ළමයින්ට අයිති

ඇටසැකිලි දෙසිය හැත්තෑ අටක් සොයාගෙන තිබෙනවා. ඇටකටු වලට යම් යම් හානි සිදුවී ඇති නමුත් ඒවා මිය යාමට පෙර හෝ පසු ව සිදු වූ හෝ සිදු කරන ලද තුවාල ද යන කරුණත් එම තුවාල මරණයට හේතු වනවාද යන්න පිළිබඳවත් තීරණය කළ හැකි වන්නේ වැඩිදුර පරීක්ෂණ වලින් පසුවයි. මෙහිදී අපේ කාර්යභාරය වන්නේ මරණයට තුඩු දුන් හේතු හා දායක වූ තත්ත්වයන්, මිය යෑමෙන් පසු ව ගෙවී ඇති කාලය සහ පුද්ගලයන්ගේ අනන්‍යතාවයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි රැස් කිරීමයි. තවද සමූහ මිනී වලෙන් සොයාගත් සියලු ඇටසැකිලි එක් ඓතිහාසික යුගයකට අදාළ ඒවාද නැතහොත් විවිධ කාල පරිච්ඡේදයන්ට අදාළ ඒවාද යන්න තීරණය කිරීමයි. පරීක්ෂණ කටයුතු වල විශ්වාසනීයත්වයත් සහ සමූහ මිනී වලෙන් සොයාගත් ඇටසැකිලි ඇතුළු වෙනත් සාක්ෂි වල ආරක්ෂාවත් තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා." විමර්ශන කණ්ඩායමට නායකත්වය දෙන අධිකරණ වෛද්‍ය නිළධාරි රාජපක්ෂ මහතාට මහාචාර්ය රාජ් සෝමදේව මහතාගේ නායකත්වයෙන් යුක්ත පුරාවිද්‍යා කණ්ඩායමක් සහය ලබා දෙයි.

සාම්පල තෝරා ගැනීමේදී සමූහ මිනී වලේ විවිධ ප්‍රදේශ සහ සිරස් ස්ථර නියෝජනය වන පරිදි සාම්පල හයක් තෝරා ගෙන ඇත. මෙම ස්ථානයෙන් සම්පූර්ණ මිනිස් ඇටසැකිලි මෙන්ම අස්ථානගත වූ අස්ථි කොටස් ද හමු විය. සම්පූර්ණ ඇටසැකිලි වලින් දතක් සහ කලව ප්‍රදේශයේ අස්ථියක් තෝරා ගත් අතර අසම්පූර්ණ ඇටසැකිලි වලින් කලව ප්‍රදේශයේ අස්ථියක් හෝ දතක් තෝරා ගන්නා ලදී. මෙම සාම්පල දින තුනක් ඇතුලත පිරිසිදු කර වියලූ පසු මුද්‍රා තබා ලේබල් කරන ලදී. රසායනාගාරයේදී පරීක්ෂා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල අනුසාරයෙන් මූලික කැඩෑම් වාර්තාවක් විමර්ශන කණ්ඩායම විසින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත යටතේ පිහිටුවන ලද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූ තැනැත්තන් සෙවීමේ සහ සොයා ගැනීමේ මූලික කාර්යභාරය පැවරී ඇත. විමර්ශනය කිරීමේ බලතල ප්‍රකාරව සැක සහිත මිනී වලවල් හැරීමේදී සහ මෘත දේහ ගොඩ ගැනීමේදී සහ ඉන් පසුව සිදුවන වෙනත් නීති කෘත්‍යවල දී නිරීක්ෂකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා අධිකරණ ආඥාවක් ලබා ගැනීමට ප්‍රාදේශීය අධිකරණ බලය ඇති උචිත මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට OMP කාර්යාලයට බලය තිබේ. (12 (ඈ) වගන්තිය) මන්නාරමේ සතොස ගොඩනැගිල්ලේ පිහිටි සමූහ මිනීවලේ කැඩෑම් ක්‍රියාවලියේදී නිරීක්ෂකයකු ලෙස කටයුතු කිරීමට OMP කාර්යාලය කල ඉල්ලීම 2018 ජූනි මස 4 වන දින මන්නාරම් දිස්ත්‍රික්කයේ ගරු මහේස්ත්‍රාත්වරයා පිළිගත් අතර OMP කාර්යාලය විසින් එතැන් පටන් එහිදී සිදු කරගෙන යන සියලු කැඩෑම් කටයුතු නිරීක්ෂණය කරමින් පවතී.

මෙම විමර්ශන කටයුතු වලට සහය දීමේ කාර්යයේ කොටසක් ලෙස OMP කාර්යාලය කාබන් ඩේටින් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර සපයනු ඇත. සාම්පල තෝරා ගැනීමට පෙර සාම්පල තෝරා ගැනීමේදී සහ ඒ සම්බන්ධව වාර්තා කිරීමේදී පිළිපැදිය හැකි මාර්ගෝපදේශ සහ නිර්දේශ OMP කාර්යාලය ඉදිරිපත් කල අතර සාම්පල තෝරා ගැනීමේදී වගවීම සහ විනිවිදභාවය සහතික කිරීම

සඳහා අතුරුදහන්වූවන්ගේ පවුල්වල නියෝජිතයන්ගේ සහභාගීත්වයේ වටිනාකම අවධාරණය කරන ලදී. සාම්පල වල භාරකාරත්වය ආරක්ෂා කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ද OMP කාර්යාලය අවධාරණය කර ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් ට අත්වූ ඉරණම සහ අතුරුදහන් වීම් සිදුවූ ආකාරය පිළිබඳ සත්‍යය සෙවීමේ වගකීම ඉටු කරලීම සඳහා කැපවී සිටින බවත් මන්නාරමේ පිහිටි සමූහ මිනීවල සම්බන්ධ විමර්ශන කටයුතු වලට දායක වීමේ වැදගත්කම පිළිබඳවත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා පවසා සිටියේ ය. 2018 ජූලි මස සිට කැධෑම් කණ්ඩායමට අවශ්‍ය ආහාරපාන සහ නවාතැන් පහසුකම් සහ වර්ෂාවෙන් සමූහ මිනීවල ආරක්ෂා කිරීමට අවශ්‍ය ආවරණ සඳහා OMP කාර්යාලය විසින් මුදල් සම්පාදනය කර ඇත. "විමර්ශන කටයුතු උසස් ප්‍රමිතීන් සහ ක්‍රමවේද වලට අනුකූලව සිදු විය යුතු බවත් මහජන විශ්වාසය පළුදු නොවන ආකාරයට විමර්ශන කටයුතු සිදු කල යුතු බවත් බලධාරීන්ගේ අවධානයට ලක් කිරීමට අප නිරන්තරයෙන් උත්සාහ කර ඇත" යනුවෙන් පීරිස් මහතා වැඩිදුරටත් පැවසී ය.